REFERENCE ONLY
18-07-2016

# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2016

## සිංහල භාෂාව හා සාහිත්‍යය

විභාග අංකය: ..........................................................

| 11 ශ්‍රේණිය | I පත්‍රය | කාලය පැය 01 |
|---|---|---|

**උපදෙස්**

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු 40 කි.
- අංක 1 සිට 40 තෙක් ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සපයන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරේ අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

- අංක 01 සිට 03 තෙක් වාක්‍යයන්හි තදකළ අකුරින් මුද්‍රිත කොටසට වඩාත් සමීප අදහස ඇති වරණය තෝරන්න.

01. "අපේ දෙමව්පියන් **අතමිට සරු අය**" බව කමලා ඇගේ ස්වාමියාට පැවසුවා ය.
    (1) හරකා බාන ඇති (2) වත්කමක් ඇති
    (3) අතේ මිටේ හයිය ඇති (4) අතින් මිටින් වියදම් කරන

02. තාත්තාට අසනීප වූ දා සිට වෙදකම් කිරීම සඳහා **හද්දිග්බාගේ** ගොස් වෙදවරුන් සෙවූ හැටි මට තාමත් මතකයට නැගේ.
    (1) සමහර තැන්වලට (2) හත් දවසක් ගොස්
    (3) දිගු දුරක් ගොස් (4) හැම අතක ම

03. "මං ඔහේ එක්ක **අබමල් රේණුවකවත්** තරහක් නැතැ"යි බොහෝ කලක් විරසක ව සිටි විමලේ සුනිමල් දුටු විට පැවසීය.
    (1) ඉතා ඉහළ ප්‍රමාණයක්වත් (2) කලාතුරකින්වත්
    (3) ඉතා සුළු ප්‍රමාණයකවත් (4) සැමවිට ම

- පහත සඳහන් වාක්‍යවල හිස්තැන් සඳහා වඩාත් සුදුසු පදය තෝරන්න.

04. ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල අධ්‍යාපනයෙහි .................... ලෙස හැඳින්විය යුතු ශ්‍රීමත් අයිවර් ජෙනිංග්ස් මහතා බ්‍රිතාන්‍ය ජාතිකයෙකි.
    (1) නිර්මාතෘවරයා (2) නියමුවා
    (3) නිර්මාණකරුවා (4) පාලකයා

05. සිංහල ගීතයේ කාර්යභාරය කුමක්දැයි ප්‍රවීණ ගීත රචකයින් විසින් නිසැක ලෙස ......................... කොට ඇත්තේ ය.
    (1) ප්‍රතිෂ්ඨාපනය (2) ප්‍රතිසංස්කරණය
    (3) ප්‍රත්‍යවේක්ෂා (4) ප්‍රතිසංවිධානය

06. එක් කරුණක් අරභයා දැක්විය යුතු සියල්ල ...................... කොට සීමා සහිත දිග ප්‍රමාණයකින් යුතුව පිළිවෙළක ට සකස් කළ ගද්‍ය නිබන්ධය වාක්‍ය රචනයකි.

(1) සංක්ෂිප්ත (2) විශ්ලේෂණය
(3) ප්‍රසාරණය (4) සම්භාව්‍ය

07. කතුවැකියේ දී ...................... මාතෘකාව ආශ්‍රයෙන් බොහෝ විට කරුණු ඉදිරිපත් කෙරෙන්නේ මධ්‍යස්ථ ආකරයෙනි.

(1) ප්‍රසිද්ධ (2) ප්‍රබුද්ධ
(3) ප්‍රස්තුත (4) ප්‍රවීණ

08. මුල් යුගවල මෙරට ලේඛන ............................ සඳහා බ්‍රාහ්මී අක්ෂර භාවිත කර ඇත.

(1) ව්‍යාපාර (2) ව්‍යුහය
(3) විස්තාරණය (4) ව්‍යවහාර

09. ඓ සහ ඖ යන ස්වර හඳුන්වන්නේ,

(1) හ්‍රස්ව ස්වර නමිනි. (2) අර්ධ ස්වර නමිනි.
(3) සංයුක්ත ස්වර නමිනි. (4) අමිශ්‍ර ස්වර නමිනි.

10. අකාරාදී පිළිවෙළ ට නිවැරදිව ලියා ඇති පද පේළිය තෝරන්න.

(1) ඉඳුවර, ඉසුරුමත්, ඉම්හිරි, ඉරිවරණ (2) නයන, නඳුන්, නවම්, නවීන්
(3) අසිත, අමල්, අනූෂා, අමිල (4) අඳුර, අලස, අවර, අසුර

11. නිවැරදි අක්ෂර වින්‍යාසය රහිත වරණය තෝරන්න.

(1) ව්‍යංගාර්ථ, අවස්ථාවෝචිත, විද්‍යුත්, විශිෂ්ඨ
(2) ඓතිහාසික, අත්‍යවශ්‍ය, ප්‍රාසංගික, සාමාර්ථ්‍යය
(3) ජ්‍යෙෂ්ඨ, විද්‍යමාන, ව්‍යාකුල, විද්‍යාලයීය
(4) ප්‍රශ්නය, කනිෂ්ඨ, පරිගණක, ශීඝ්‍රගාමී

12. 'බලහු' යන කර්තෘ කාරක, වර්තමාන කාල, මධ්‍යම පුරුෂ බහු වචන ආඛ්‍යාතයෙහි කර්මකාරක, අතීතකාල, මධ්‍යම පුරුෂ බහුවචන රූපය වන්නේ,

(1) බැලුණුහු (2) බැලෙන්නෙහු
(3) බැලෙහු (4) බලනු ලැබෙහු

13. විරුද්ධාර්ථ පදයක් සහිත පද පේළිය තෝරන්න.

(1) අචල - තිර, නිසල, ස්ථාවර, නිශ්චල (2) අල්ප - අනල්ප, ඌන, විරල, ඌනු
(3) ඇස් - චක්ෂු, නේත්‍ර, නුවන්, අක්ෂි (4) කුඩා - සුළු, ටික, ක්ෂුද්‍ර, මිටි

14. අනුක්ත පද දෙකක් පමණක් යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) කිරිල්ලියක්, ගිරවු, අයෙක්, ළමයින් (2) මා, තොපි, ගැමියෙක්, ගායකයෙක්
(3) විද්වතුන්, සමහරු, ඔවුහු, අප (4) තොමෝ, ඇතැමෙක්, මොනරු, කවුරු

15. 'සෞන්දර්ය' යන පදයේ ප්‍රකෘතිය වන්නේ,

(1) සෞන්දර (2) සුන්දර
(3) සුන්ද (4) සෞන්දර්

16. මුලින් දී ඇති ව්‍යාකරණ වර්ගයට අයත් නොවන පදයක් සහිත පද පේළිය තෝරන්න.

(1) තද්ධිත පද - විවිධත්ව, දිරිමත්, කරටි, සවනත්

(2) කෘදන්ත පද - ලියවිලි, මැරුණු, බැලූ, නටයි

(3) නිපාත පද - මෙන්, ඉක්බිති, වනාහි, තරම්

(4) උපසර්ග පද - අතිකාල, ප්‍රතික්‍රියා, උපදේශ, ඉපැරණි

17. පහත සඳහන් සන්ධි පද අතුරෙන් මුලින් දැක්වූ සන්ධි වර්ගයට අයත් නොවන පදයක් සහිත පද පේළිය තෝරන්න.

(1) ස්වර සන්ධිය - බළලුන්ගේ, ගසෙහි, අතිනත, සතුරා

(2) පරස්වර ලෝප සන්ධිය - පිළිතුරු, අනුරුත්, සුරඟන, මුදලිඳු

(3) ස්වරාදේශ සන්ධිය - ලඹෝදර, දෑවර, වටොර, දැත

(4) ආගම සන්ධිය - දරුවෝ, මියුගුණු, හෙළයෝ, දෙයාකාර

18. පහත වාක්‍යවල ඉරි ඇඳි පදය අයත් විභක්තිය නිවැරදි ව පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) ඒ ඉතා මිහිරි කවිය <u>ගැල්කරුවාගේ</u> ය.

(2) ගොවියෝ වගා <u>ළිඳෙන්</u> ජලය ගත්හ.

(3) දෙමව්පියෝ <u>දරුවන්</u> යහමග යවති.

(4) සත්ත්වවේදීන් විසින් <u>සත්තු</u> පරීක්ෂා කෙරෙති.

(1) ප්‍රථමා, සම්බන්ධ, කර්ම, අවධි (2) අවධි, සම්බන්ධ, ප්‍රථමා, කර්ම

(3) සම්බන්ධ, කර්ම, අවධි, ප්‍රථමා (4) සම්බන්ධ, අවධි, කර්ම, ප්‍රථමා

19. A - ඔහු වහාම ක්‍රියාත්මක විය. ප්‍රතිවාදියාගේ ප්‍රයත්නය අසාර්ථක විය.

B - ගුරුවරයා ශිෂ්‍යයාගෙන් ප්‍රතිඵල අපේක්ෂා කරන්නේ ය. ඒ සඳහා ශිෂ්‍යයාට උපකාරි විය යුතුය.

C - අම්මා ගමට යයි නැතහොත් තාත්තා ගමට යයි.

D - රසවින්දනයට බස දැනගැනීම අවශ්‍යයි. රසවින්දනය හේතු කොට ගෙන බස පිළිබඳ දැනුම වර්ධනය වේ.

ඉහත වාක්‍යය තනි වාක්‍යය වශයෙන් ගැළපීමේ දී නිපාත පද භාවිතයේ වඩාත් යෝග්‍ය අනුපිළිවෙළ වනුයේ,

H - නම් I - නිසා J - හෝ K - අතර

(1) H J I K (2) K I J H

(3) I H J K (4) J H I K

20. යුගල පදයක් නොවන පදයක් සහිත පද පේළිය තෝරන්න.

(1) අටුකොටු, යනඑන, අනංමනං, ජරමර

(2) කුලීමලී, සද්දබැද්ද, උසුළුවිසුළු, තරහමරහ

(3) ඉඟිබිඟි, හරිබරි, ගේදොර, ඇලිමැලි

(4) කයිකතන්දර, ආලපාලු, හැළිවළං, පොතපත

- පහත ප්‍රකාශයට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.

21. කවර පැත්තක් ගනිම්දැයි සිත සිතා සිටීම.
    (1) කණ කැස්බෑවා විය සිදුරෙන් අහස බැලුවා වගේ
    (2) කපන්න බැරි අත සිඹිනවා වගේ
    (3) හැදෙන ගහ දෙපෙත්තෙන් දනේ.
    (4) එළිපත්ත උඩ ඉන්න බළලා වගේ

- අංක 22 සිට 23 තෙක් ඇති එක් එක් පද යුගලෙහි දෙවන පදය පළමුවැන්න ට අර්ථයෙන් <u>සමාන</u> ද අර්ථයෙන් <u>විරුද්ධ</u> ද, අර්ථය <u>වැඩිකරයි</u> ද, <u>වෙනස්</u> අර්ථ සහිත වේ ද යන්න තෝරන්න.

22. ප්‍රාචීන - ප්‍රතිචීන
    (1) සමාන (2) විරුද්ධ (3) වැඩි (4) වෙනස්

23. පිරිකුඹු - පිරුණු කළය
    (1) සමාන (2) විරුද්ධ (3) වැඩි (4) වෙනස්

24. සිනිඳු - සුසිනිඳු
    (1) සමාන (2) විරුද්ධ (3) වැඩි (4) වෙනස්

25. වැරදි අදහස දෙන වරණය තෝරන්න.
    (1) උ, ඌ යනු ඕෂ්ඨජ අක්ෂර දෙකකි.
    (2) තත්ත්ව යනු තද්ධිත පදයකි.
    (3) කාර්යාලයේ සේවකයන් ඇත. මෙය නිවැරදි වාක්‍යයකි.
    (4) ප්‍රතිසංස්කරණය යන්නෙහි උපසර්ග පදයක් ඇත.

26. දුද නොද බිඳ
    බඳ තෙද කඳ
    කඳ දෙව් රද සාමිනේ

    මගෙ කුකුළා නැසු එකා
    දද ය ඔබගෙ පාළු යකා
    ඉන්නට ඉඩ නොදී මකා

    ඉහත පද්‍යයෙන් ගම්‍ය වන රසය වනුයේ,
    (1) රෞද්‍ර රසය (2) හාස්‍ය රසය
    (3) වීර රසය (4) ශාන්ත රසය

27. අනුරූප පද යුගල (තත්සම, තත්භව) ලෙස නොයෙදුණු පද යුගල තෝරන්න.
    (1) ආඥා චක්‍රය - අණ සක (2) දෘශ්‍ය කාව්‍ය - දිසි කව්
    (3) ආකාශ ගංගාව - නුබ ගැබ (4) ශ්වේත ඡත්‍රය - සුදු කුඩය

28. "තරු ලකුණ" නැමති විරාම ලක්ෂණය යෙදෙන්නේ,
    (1) පහතින් දක්වා ඇති බව දැක්වීමට ය.
    (2) යම් අදහසක් තවදුරටත් විස්තර කිරීමට ය.
    (3) ප්‍රකාශනයක හිස් තැන දැක්වීමේ දී ය.
    (4) අත් හැරුණු අකුරු, පද, වාක්‍ය නැවත එක් කිරීමෙහි යෙදේ.

18.07.2016 REFERENCE ONLY

29. එක් එක් පද පේළිවල දී ඇති පදවලට සමානාර්ථ යෙදුම් පමණක් ඇතුළත් පද පේළිය තෝරන්න.
(1) ගොන්ගේ - හරක්බාන, අසේව - වෙහෙසව, අර්චනිය - අහේනිය, ආප්ත - වැඩිහිටි
(2) ක්ෂුධාවෙන් - කුස ගින්නෙන්, ශිර්ෂ කපාලය - හිස් කබල, සම්මුතිය - එකඟතාව, කරදිය - කරිජ්ජ
(3) පන්න කිරීම - මසුන් මැරීම, බුජබල - බල ශක්තිය, කිවියුරු - කවියට අධිපති, චිරන්තන - පුරාතන
(4) අප්‍රතිහත - බොහෝ, උදක - ජල නිධාන, ව්‍යාඛ්‍යාන - අර්ථහීන, අතික්‍රමණය - ඉක්මවායාම

- අංක 30 සිට 34 දක්වා දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල නිවැරදි වාක්‍ය තෝරන්න.

30. (1) අශෝක රජතුමා දැහැමි පාලකයෙකු ද?
(2) අපි ශ්‍රී ලාංකික පුරවැසියෝ
(3) සියලු මිනිස්සු සත්‍යගරුක විය යුතුය.
(4) පයින් යන්නන් පාරේ දකුණු පසින් යා යුත්තාහ.

31. (1) සූර්ය තෙමේ චණ්ඩ රශ්මිය පතුරුවන්නට වූහ.
(2) සොරුන් දෙදෙනෙක් අත්අඩංගුවට පත්වූහ.
(3) ක්‍රීඩකයෝ දුවද්දී අපි බලා සිටියෙමු.
(4) මිනිසුන් අවංක නොවන්නේ ඇයි?

32. (1) විදුහල්පතිතුමා ශිෂ්‍යයන් ඇමතූහ.
(2) ගුරුවරියක ශිෂ්‍යාවක කැටුව පාසලට ගියාය.
(3) නිළියක රැඟුමක් පාති'යි ප්‍රේක්ෂකයෝ අපේක්ෂා කළහ.
(4) කුරුල්ලෝ කැදලි කරා පියාඹනු ඇත.

33. පහත දක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැර වූ විට වඩාත් නිවැරදි වරණය වන්නේ,
මම පාසලට යන විට ගුරුවරු පැමිණ සිටියා.

(1) මම පාසල ට යද්දී ගුරුවරු පැමිණ සිටියහ.
(2) මා පාසල ට යද්දී ගුරුවරු පැමිණ සිටියහ.
(3) මා පාසල ට යද්දී ගුරුවරුන් පැමිණ සිටියෝ ය.
(4) මා පාසල ට යද්දී ගුරුවරු පැමිණ සිටියේ ය.

34. උදුළ සොමි කැලුම් නිසයුරු හිමි පුවළ
පහළ වන බැවින් තම වෙත නිසඹු දොළ
ලකළ ගුවන් තල සිරි යහන නිකසළ
අතුළ කුසුම් විලසින් සැදෙත තුරු වැළ

ඉහත පද්‍යයේ උදුළ, කැලුම්, ලකළ, අතුළ යන පදවල අර්ථ පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) බබළන, කාන්තියෙන්, අලංකාර, අතුරන ලද (2) කාන්තියෙන්, බබළන, අලංකාර, අතුරන ලද
(3) බබළන, අලංකාර, කාන්තියෙන්, අතුරන ලද (4) අතුරන ලද, අලංකාර, බබළන, කාන්තියෙන්

35. පහත සඳහන් පද්‍යයේ දී ඇති වරණ අතුරෙන් හතරවන පද්‍ය පාදය තෝරන්න.

සීත කරන උඳුවප් මහ දුරුත්තේ
සීතල උහුලන්ඩ මට බැරුවා සත්තේ
කැලේ මදුරු මැසි කරදර තොර නැත්තේ

(1) මගේ දුකට නුඹ පමණයි මට ඇත්තේ
(2) පැලේ ගින්න විතරයි හැමට ම ඇත්තේ
(3) සිතේ දුකට කවි කියවෙනවා සත්තේ
(4) පැලේ ගින්න විතරයි තනිය ට ඇත්තේ

36. ජනතාවගේ සභ්‍යත්වයත් බුද්ධි විකාශයත් විනිශ්චය කිරීම ට ඔවුන්ගේ සාහිත්‍ය කලා උපකාර වෙයි සාහිත්‍ය වූ කලී සභ්‍යත්වයෙහි වැඩීම බස දන්නවුන් ට පමණක් ඇසෙන සේ කියන්නකි.
ඉහත ගද්‍ය කොටස උපුටාගත් කෘතිය වනුයේ,

(1) නිර්මාණ පසුබිම (2) සිංහල කතා කලාවේ විකාශය
(3) සිංහල සාහිත්‍යයේ නැගීම (4) සාහිත්‍ය විද්‍යාව

37. කමත් භාෂාවේ හරක් කැරැල්ලේ අවසාන හරකා හඳුන්වන්නේ,

(1) කොළමුත්තා ය. (2) කලාතයා ය.
(3) මට්ටයා ය. (4) එළවිස්සා ය.

38. 1. මුද්‍රණ ශිල්පය පැමිණීමත් සමඟ පොත්පත් ප්‍රකාශනය ව්‍යාප්ත වේ.
2. බුදුන් වහන්සේ දේශනා කරලා තියෙනවා ජලය ට අපද්‍රව්‍ය දැමීම ආපත්ති කාරණයක් බව
3. කාල තුවක්කු වෙඩි සහ කොඩිතුවක්කු විසිපහ ගණින් ගත නොහැකි තරම් මහත් ඝෝෂාවක් එදා පැවැත්තුවා ය.
4. ශ්‍රී ලංකාව දකුම්කලු එමෙන් ම ස්වභාව සෞන්දර්යයෙන් අනූන රටකි.

ඉහත වාක්‍යාංශය උපුටාගත් පාඩම් පිළිවෙළින්,

A - දළදා පෙරහැර B - වාක්‍ය රචනය
C - රසින් රස මවන බස් මහිමය D - දියවර සිරිසර

(1) A B C D (2) B C D A
(3) C D B A (4) C D A B

39. පහත සඳහන් කවියේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.

නුබ සා මඬුලු සඳ වෙල ළපලු පැහැපත
උදය'ග රැක සද මල් කැනක සිරි ගත

(1) අහස නැමති ශාඛා මණ්ඩල ද ප්‍රභා සම්පන්න සන්ධ්‍යා වලාකුළු නැමැති ළා දලු ද සහිත උදය පර්වත නැමැති ගසෙහි මල් කිනිත්තක ශෝභාව ගනියි.
(2) අහස නැමැති ළා දලු ප්‍රභා සම්පන්න සන්ධ්‍යා වලාකුළු නැමති ශාඛා මණ්ඩලය ද සහිත උදය පර්වත නැමැති ගසෙහි මල් කිනිත්තක ස්වභාවය ගනියි.
(3) උදය පර්වතය නම් ගසේ මල් කිනිත්තක පිපුණු මල් නැමැති ළා දලු අහස නැමති ශාඛා මණ්ඩලය ද අලංකාරය උපදවයි.
(4) මල් කැන් වැනි වූ උදය පර්වත නැමැති අහසෙහි ඇතිරූ ළාදලු ශාඛා මණ්ඩලයක සිරි ගත්තේ ය.

40. පහත දී ඇති ඡේදයේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.
රටක සැබෑ දියුණුවක් ඇති වීම ට එරට වැසියන් බුද්ධිමත් අය විය යුතු අතර නිරෝගී අය ද, විය යුතුය. ඔවුන් අංග සම්පූර්ණ අධ්‍යාපනයක් ලැබිය යුතුය.

(1) රටක යථාර්ථවත් දියුණුව සඳහා එරට වැසියන් සබුද්ධිමත්, නිරෝගී අය විය යුතුය.
(2) රටක සැබෑ දියුණුවක් වන්නට එරට පාලකයන් බුද්ධිමත් විය යුතු අතර ජනතාව නිරෝගී හා නියම ඉගෙනීමක් ලද යුතුය.
(3) රටක වැසියන් බුද්ධිමත් සෞඛ්‍ය සම්පන්න හා පරිපූර්ණ අධ්‍යාපනයක් සහිත නම් එරට සැබෑ දියුණුවක් ඇතිවෙයි.
(4) අධ්‍යාපනය තුළින් බුද්ධිමතුන් බිහිවන අතර ඔවුන් නිරෝගී නම් රටේ දියුණුව ට ඔවුන් හවුල්කර ගත හැකිය.

REFERENCE ONLY

2016-07-18

# මීගමුව අධ්‍යාපන කලාපය
# දෙවන වාර ඇගයීම - 2016
# සිංහල භාෂාව හා සාහිත්‍යය

විභාග අංකය: ..........................................

| 11 ශ්‍රේණිය | II පත්‍රය | කාලය පැය 2 |
|---|---|---|

**උපදෙස්**

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ප්‍රමාණය 80 කි.

01. අංක i සිට x දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසක ට පිළිතුරු නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් කෙටි ඉරක් අඳින්න.

i. ග, ජ, ඩ, ඳ, ඹ සඤ්ඤක අක්ෂර නම්,

(අ) අන්තඃස්ථාක්ෂර දෙකක් ලියන්න. (ආ) අනුනාසික අක්ෂර දෙකක් ලියන්න.

ii. පහත සඳහන් වාක්‍යයේ උපසර්ග පද දෙකක් උපුටා ලියන්න.

එලෙස මෙහි සපැමිණි විදේශීය ලේඛකයන් මේ පුණ්‍ය භූමිය පිළිබඳ කළ නිර්මාණ බොහෝ ය.

iii. පහත සඳහන් (අ) සහ (ආ) යටතේ දැක්වෙන අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියා දක්වන්න.

(අ) ඉබේ ක්‍රියාකරන - (ආ) කළ වරද ගැන කනගාටු වීම -

iv. පහත සඳහන් පද්‍ය ඛණ්ඩවල ඉරි ඇඳි පද අයත්වන ක්‍රියා වර්ගය නම් කරන්න.

(අ) නගෝ අපට ඇඹුල අරන් වෙලට <u>වරෙන්නේ</u>

(ආ) ගෙට <u>ගිය</u> අඹු නසී - මග රැඳුන තෝ නසී

v. දෙන ලද ප්‍රකාශයේ සඳහන් තද්ධිත හා කෘදන්ත පද උපුටා දක්වන්න.

ශිලාමය ප්‍රතිමා නිර්මාණය කිරීමේ කුසලතාව දක්වන්නෝ දුර්ලභ වෙති.

(අ) තද්ධිත - (ආ) කෘදන්ත -

vi. පහත දැක්වෙන පද සන්ධි කොට සන්ධි වර්ගය ලියන්න.

(අ) මහ + ඉසිකා (ආ) තුනු + අග

vii. පහත දැක්වෙන (අ) සහ (ආ) යෙදුම්වල පළමුවෙනි වචනය සමග දෙවන වචනයේ නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමු වචනය හෝ දෙවන වචනය හෝ සකස් කර ලියන්න.

(අ) ත්‍රිපිටක දහම - (ආ) කල්‍යාණ මිතුරා -

viii. පහත වාක්‍යවල ඉරිඇඳි පදවල විභක්ති නම් කරන්න.

(අ) <u>දෙමව්පියෝ</u> ක්‍රීඩා උත්සවය නරඹති.

(ආ) ඇතැම් පාසල් ශිෂ්‍යයෝ සුරතල් <u>මසුන්</u> ඇති කරති.

ix. පහත දී ඇති කර්තෘ කාරක වාක්‍ය කර්ම කාරක වාක්‍ය බවට හරවන්න.

(අ) වෛද්‍යවරු රෝගීන් සුවපත් කරති.

(ආ) වැත්තෑවේ හිමි ගුත්තිල කාව්‍ය රචනා කළේය.

X. පහත සඳහන් යෙදුම් සඳහා හේන ආශ්‍රිත භාෂා ව්‍යවහාරයේ යෙදෙන වචන ලියන්න.

(1) පාවහන් (2) අලියා

(ලකුණු 2 X 10 = 20 යි)

02. පහත දැක්වෙන අ, ආ, ඉ, ඊ යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250 කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා සුදුසු මාතෘකාවක් ද යොදන්න.

- අන්තර්ගත විය යුතු කරුණු
- ඡේද සංඛ්‍යාව
- කරුණු පෙළ ගැස්වීමේදී අනුගමනය කළ හැකි ක්‍රියා පිළිවෙළ
- යොදා ගත හැකි මාතෘකාව

ආදිය පිළිබඳ මගපෙන්වීමක් අදාළ විස්තරය ඇසුරෙන් ලබා ගන්න.

(අ) මුළු ජල ප්‍රමාණයෙන් 97% ක් කරදියයි. 3% මිරිදියයි. එයිනුත් වැඩි කොටසක් ධ්‍රැවීය අයිස් තට්ටුවල සහ ග්ලැසියරවල බැඳී ඇති නිසා ප්‍රයෝජනයට ගත නොහැක. මිනිසා ට පහසුවෙන් ප්‍රයෝජනය ට ගත හැක්කේ විල්, ගංගා, ඇළ, දොළ, ආදියෙහි ඇති මිරිදිය සහ පොළොව මතුපිට ආසන්නයේ ඇති මිරිදියයි. ඒ අනුව බලන විට සීමිත වූ ජලසම්පත රැක ගැනීම කෙරෙහි අප අවධානය යොමුවිය යුතු කරුණකි.

(ආ) නූතනයේ ඉලෙක්ට්‍රෝනික උපාංග ශීඝ්‍රව මිනිසා අතට පත් වී ඇත. ජංගම දුරකථනයක් නොමැති අයෙක් සොයා ගැනීම පවා උගහට ය. නමුත් ජංගම දුරකථන භාවිතය පිළිබඳ ආචාර ධර්ම පද්ධතියක උවමනාව දන් දූත් කාහටත් දැනෙන දෙයක් බව ට පත්ව ඇත. පසුගිය කාලයේ ඇති වූ දුම්රිය අනතුරු හා රථ වාහන අනතුරු දෙස බලන විට බොහෝ අනතුරු ජංගම දුරකථන භාවිතය හා සබඳතාවයක් පවතියි. එසේම පාසල් සිසුන් ජංගම දුරකථන භාවිතය පිළිබඳව ද නැවත සිතා බැලිය යුතු කරුණකි. ජංගම දුරකථන භාවිතය සමාජ පරිහානිය ශීඝ්‍ර කරයි නම්, එම තාක්ෂණය භාවිතය ට අවශ්‍ය ජන මතය සකස් කිරීම යුගයේ අවශ්‍යතාවයකි.

(ඉ) සාහිත්‍ය ජනතා උරුමයකි. ඉන් රටේ සාමාජික සංස්කෘතික හා දේශපාලනික තොරතුරු නිරූපණය වේ. පුද්ගලයා තුළ යහපත් ආකල්ප වර්ධනය සඳහා සාහිත්‍ය පාදක වෙයි. ඒ අනුව ජනතා සිතුම් පැතුම් යහ මග ට පත් කර සාමකාමී පුරවැසි පිරිසක් බිහිකර ගැනීමට සාහිත්‍ය ඉවහල් කර ගත හැකිය.

(ඊ) පුවත්පත තවමත් ජනතාවට තොරතුරු සපයන ප්‍රබල මුද්‍රිත මාධ්‍යයකි. පුවත්පතේ කාර්ය භාරය අතර වැදගත් වන්නේ නිවැරදි තොරතුරු කලට වේලාව ට සැපයීම ය. පුවත්පතින් සමාජ, ආර්ථික, සංස්කෘතික තොරතුරු ඉදිරිපත් කිරීමෙන් ජනතාවගේ දැනුම පෝෂණය වෙයි. වාණිජත්වය ට බර වූ ඇතැම් පුවත්පත්වල පළවන හානිකර පුවත් රටට විනාශයකි. පුවත්පතේ වගකීම සමාජ සුචරිතය සැලසීම ය.

(ලකුණු 25 යි.)

03. පහත දැක්වෙන ඡේදය වචන 50 - 60 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

ප්‍රතිජීවක ගැන නොදනිතත් බොහෝ ජනතාව සෙම කර වීමට හෝ තුවාල වේලීම ට දෙන කරල් ගැන දන්නා සෙයකි. සිරුරේ හට ගන්නා හෝ හට ගැනීමට ඉඩ ඇති බැක්ටීරියා ඇතුළු ක්ෂුද්‍රජීවී ආසාදන පාලනය කිරීම සඳහා ලබාදෙන ප්‍රතිජීවක බටහිර ඖෂධ ලෝකයේ සුවිශේෂී ඖෂධ කාණ්ඩයක් ලෙසින් සැලකේ. එහෙත් මෙම බල සම්පන්න ඖෂධවල බලය බිඳීයන තත්ත්වයට පත්ව ඇත්තේ ඒවා අනිසි ලෙස පරිහරණය කරන නිසා ය. වෙසෙසින් ම වෛද්‍ය නිර්දේශයකින් තොරව මේ ඖෂධ ලබා ගැනීම ට ඇතැම් පුද්ගලයන් කටයුතු කරන නිසා ය. ඔවුන් ප්‍රතිජීවක සලකන්නේ කෝකටත් තෛලයක් කියා ය. ඇතැම් වෛද්‍යවරුන් ද ඉවක් බවක් නොමැතිව හිතුමතේ විවිධ ප්‍රබල ප්‍රතිජීවක ඖෂධ පවා නිර්දේශ කරන තත්ත්වයක් අද අප සමාජයේ පවා දක්නට ඇති බව මෙරට වෛද්‍ය පර්යේෂකයෝ පවසති.

මේ තත්ත්වය නිසා සිදුව ඇත්තේ එක් එක් ප්‍රතිජීවක ඖෂධ සම්බන්ධයෙන් ඔරොත්තු දීමේ හැකියාවන් විවිධ රෝග කාරක ක්ෂුද්‍ර ජීවීන් තුළ හට ගැනීමයි. මෙයින් සිදුවන්නේ යම් රෝගයකට ප්‍රතිජීවක ලබා ගත්තද සුවයක් නොලැබීම ය. මේ නිසා ඊට වඩා ප්‍රබල ප්‍රතිජීවකයක් ගැනීමට සිදුවේ. එයට ද ප්‍රතිරෝධීතාවක් හට ගතහොත් තවත් ප්‍රතිජීවකයක් ගත යුතු ය. මේ තත්ත්වයට හේතුව වන්නේ අනිසි ලෙස ප්‍රතිජීවක පරිහරණය කිරීමයි. මේ නිසා රෝගීන් ලෙස අප කළ යුතු වැදගත් පියවර කීපයක් ඇත එයින් වැදගත් ම දේ වෛද්‍ය නිර්දේශයකින් තොරව ප්‍රතිජීවක භාවිතයෙන් වැළකීම ය. දෙවැන්න ලබාදෙන සම්පූර්ණ මාත්‍රාව ම අවසන් වන තෙක් ලබා ගැනීම ය.

(ලකුණු. 10 යි)

04. පහත සඳහන් පද්‍ය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ඉණට මඩකලපුවේ සරමකි ලබාගත් දිය ලනුවෙ පැටලිලි
ඔඩොක්කුව තුළ මඩිස්සලයකි තිබෙයි එහි තුළ විටේ සැලකිලි
පැසී එන වෙල් යායකට බඳු හිසේ කොණ්ඩය හැඩයි තලගුලි
සිහින් දිග යටි රැවුළ සුදු පැහැ ගැනී ඉපිළි සිරුර සම රැලි

ලේන්සුව බැඳ හිසෙහි බාගෙට බුලත් කෙළ යටි රැවුළෙ පෙරෙමින්
කරුන්කා ගෙඩි විකන කුරහන් දසන් දක්වා දෙතොල සලමින්
උරේ නැගි කරගැටය මතුපිට මදක් බර කත් ලීය තබමින්
කදින් කිරි කිරි හඬක් නහවා වමත ගමනට අනුව සලමින්

ගමේ සිට ගම්මිරිස් කප්පු දෙහි ගොරක බෙටි අඹ රසැති මීයේ
කදක ලා උවමනා දේ ඇත හඬින් අමතා කදෙහි ලීයේ
නහර ගැට ඇති දෙපය ගුරු මාවතක් අතරින් ගෙනන සීයේ
ඔබේ සිරුරෙන් රටට පෙන්වයි පැරණි සිංහල ගතිය ආයේ

ගසක් යට මඳ විඩා හරිමින් බිම තබා කද උරය මත්තේ
විටක් කන්ට ද ඉණේ රඳවා තිබුණු හැඹිලිය අතට ගත්තේ
පෙළක් අප තරුණයන් හට මෙන් ඔබට උපනෙත් පිහිටා නැත්තේ
හුඟක් මොකට ද හැට නමේදිත් කුඩු බවක් නැහැ ඔබගෙ මුත්තේ

1. ඉහත පද්‍ය පන්තියෙහි කියවෙන පුද්ගලයා කරන රැකියාව කුමක් ද?
2. ඉහත පද්‍යයේ ගැමි ලක්ෂණ නිරූපණය වන අවස්ථා 02ක් ලියන්න.
3. "නහර ගැට ඇති දෙපය ගුරු මාවතක් අතරින් ගෙනෙන සීයේ" යන පද්‍ය පාදයේ අර්ථය ලියන්න.
4. මෙහි එන පුද්ගලයා වයසට ගියත් ශරීරයෙන් තරුණ බවක් පෙන්වන බව කියවෙන පද්‍ය පාද දෙක ලියන්න.
5. පහත පදවල අර්ථ ලියන්න.

1. උපනෙත් 2. දසන් (ලකුණු 2 X 5 = 10 යි.)

05. පහත සඳහන් අවස්ථාව සම්බන්ධ කරගෙන වචන 125 කට නොඅඩු න්‍යාය පත්‍රයක් සකස් කරන්න.

ඔබේ පාසලේ අභිනවයෙන් ඉදි වූ තාක්ෂණික විද්‍යාගාරය සිසු අයිතියට පත් කිරීමේ උත්සව අවස්ථාවට සුදුසු න්‍යාය පත්‍රය සකස් කරන්න. (ලකුණු 15 යි)

නැතහොත්

වකුගඩු රෝගීන් බහුලව ජීවත්වන ඔබ ප්‍රදේශයේ ජල ප්‍රශ්නය සඳහා විසඳුමක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිමින් මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා වෙත යැවෙන රාජකාරි ලිපිය සකස් කරන්න. ඔබ ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් මහීපාල සිල්වා යැයි සිතන්න. (වචන 125 ක් පමණ.)

(ලකුණු 15 යි)

REFERENCE ONLY

18 . 06 . 2016

මීගමුව අධ්‍යාපන කලාපය

# දෙවන වාර ඇගයීම - 2016

# සිංහල භාෂාව හා සාහිත්‍යය

විභාග අංකය: ...............................................

| 11 ශ්‍රේණිය | III පත්‍රය | කාලය පැය 2 |
|---|---|---|

**උපදෙස්**

- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ප්‍රමාණය 80 කි.
- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- අංක (1), (2), (3), (4) ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.
- අංක i සිට x දක්වා ඇති සියලු ම ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න. කිසියම් අනුකොටසක ට පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් කෙටි ඉරක් අඳින්න.

01. i. මහෞෂධ 'පණ්ඩිතයන් දන් එති, දන් එති' මහ බෝසතාණන් වහන්සේ වඩනා පෙර මඟ කර ඔසවා - ඔසවා බලාගෙන සිටීමෙන් කොක් කරක් සේ දික් වූ කර ඇති වූහ.

1. කොක් කරක් සේ දික් වූ කර ඇති වූයේ කාට ද?
2. ඉහත ප්‍රකාශය ඇතුළත් ජාතක පොත ලිවීම සඳහා අනුග්‍රහය දක් වූ අමාත්‍යවරයා කවුද?

ii. තත මතු ද සින්දේ
පිළිමල් දප ද සින්දේ

1. මෙහි පිළිමල් යන්නෙහි අර්ථය ලියන්න.
2. ඉහත පද්‍යයේ ඉතිරි පද්‍ය පාද දෙක ලියන්න.

iii. 'මඟ අසබඩ කෙතක් රකිනා සිංහල කාන්තාවක ජාති, ජරා මරණ ආදිය පිළිබඳ සිංහල බසින් කී ගීයක් අසා සඟ සැට නමක් රහත් වූහ.'

1. ඉහත පාඨය සඳහන් වන්නේ කවර කෘතියක ද?
2. ඉහත තොරතුරු අනුව ජන කවියේ ඉතිහාසය කවර යුගයක් කරා දිව යන්නේ ද?

iv. 'මිනිහා අනුමානයක් නෑ මැරෙන්න ඇති'යි ඔහු කීය.

1. ඉහත ප්‍රකාශයේ ඔහු යනුවෙන් අදහස් වන්නේ කවුරුන් ද?
2. ඉහත ප්‍රකාශය ඇතුළත් නවකථාව රචනා කළ ලෙනාඩ් වුල්ෆ් මහතා විවාහ වී සිටි ප්‍රකට නවකතා කතුවරිය කවුද?

v. ජාතික රණ දෙරණ මතේ
ගැටී වැටී මළ මොහොතේ
සුන්දර සුරඹුන්ගෙ අතේ
නැළවෙන බව සිතනු පුතේ

1. ඉහත පද්‍ය රසවිඳීමේ දී ඇතිවන රසය කුමක් ද?
2. එස් මහින්ද හිමිගේ ළමා පද්‍ය කෘතියක් ලියා දක්වන්න.

vi. 1. එච්.එම්. කුඩලිගම කවියාට සමකාලීන වෙනත් කවියෙකු නම් කරන්න.

2. එච්.එම්. කුඩලිගම රචිත කාව්‍ය ග්‍රන්ථයක් ලියා දක්වන්න.

vii. තුමුල ගතින් දා
බාහු බෙලෙන් දා
වෙමි සේ තිදසින් දා
කුරිරු ගජින්දා
කුඹුතල සින්දා

1. ඉහත දක්වෙන්නේ සිංහබාහු නාට්‍යයෙන් උපුටා ගත්තකි. මෙම නාට්‍යයේ නාට්‍ය ශෛලිය කුමක් ද?

2. "වෙමි සේ තිදසින්දා" යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?

viii. මෙ වෙනි සිංහ නාදයක් අනෙකක් හට වන්නේ නොවෙයි.

1. මෙසේ සිතුවේ කවු ද?

2. සිංහ නාදයට සමාන කළ හඬ ඇත්තේ කාට ද?

xi. හේනේ පැලේ මා විදිනා සුරුක්කන්
ඌරෝ ඇවිත් වට පිට කරති සක්මන්
වැටටත් උඩින් උන් අල්ලන මලක්කන්
අපොයි මගේ කිරි වදිනා කුරක්කන්

1. මෙම කවිය අයත් වන්නේ කුමන ජන කවි වර්ගයකට ද?

2. "වැටටත් උඩින් උන් අල්ලන මලක්කන්" යන්නෙහි අර්ථය ලියන්න.

x. <u>මීහ'ඹු</u> මුව මඩල මෙන් දිලෙන හැම විට
දුලබ ඉසුරු පිරි සැදි ඒ වෙහෙර සිට

1. ඉරි ඇඳි පදයේ අර්ථය කුමක් ද?

2. ඉහත පද්‍ය පාද උපුටා ගත් කෘතියේ කතුවරයා කවුද? (ලකුණු 2 X 10 = 20)

02. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

i. ඔහු දු මා අතැ නස්ති. එතකුදු හොත් මෙ මහණ **එකලා** වැ මා අභිභවමින් මෙන් එයි. මෙ මහණහු මැරුව මැනවැ'යි කඩු පළඟ ගෙනැ දුනු **හියවුර** බැඳ බුදුන් පස් පස් ලුහු බඳවමින් යෙයි.

1. මේ පාඨය හා සම්බන්ධ සිද්ධිය කෙටියෙන් ලියන්න.

2. අංකිත පදවල අර්ථ සපයන්න.

ii. සාර පලය අඹ, **දඹ**, රඹ ද **වල්** පිට
මීර ජලය ඇළ දොළ කඳු පිටින් බට
නැර ලොලය වඩවන දුටු දනන් හට
කැරගලය වැජඹෙයි මේ ලෙසින් සිට

1. මෙම ප්‍රදේශයේ ස්වාභාවික සෞන්දර්ය හා සශ්‍රීකත්වය පිළිබඳ කියවෙන කරුණු දෙකක් ලියන්න.

2. අංකිත පදවල අර්ථ සපයන්න.

1. වල්පිට - 2. දඹ -

iii. උග්ගසේන සිටුපුත්‍රයාණෝ කර'ග රහත් වන්නාසේ නොවන බව මුත් හුණ දඬු අග දී **පිළිසිඹියා** පත් රහත් ව හුණ දණ්ඩෙන් බැස පියා බුදුන් ළඟට ගොසින් **පසඟ පිහිටුවා** වැඳ ගෙන මහණ කරන්නට ආරාධනා කළහ.

1. මෙම ඡේදයේ කියවෙන උග්ගසේන ආධ්‍යාත්මිකව ලැබූ ජයග්‍රහණය කෙටියෙන් විස්තර කරන්න.
2. අංකිත පදවල අර්ථ සපයන්න.

iv. බැඳි දන මන වැයුමෙහි ඇඳුරෝයා
විඳි සත්සර වෙණ සර මධුරෝයා
රැඳි සතොසින් සැනහුණු ඉඳුරෝයා
වැඳි දන සිරි ගත්තුය කිඳුරෝයා

1. ගුත්තිල පඬිතුමාගේ වීණා වාදනයේ මිහිරි බව කියා පෑමට උක්ත කවිය යොදා ගන්නා අයුරු කෙටියෙන් පහදන්න.
2. මෙම පද්‍යයේ ඇතුළත් කාව්‍යෝපක්‍රමයක් ලියා දක්වන්න.

v. අසිරිමත් වූ දේකි මෙලොව
ප්‍රේමය නමිනා
වැනූ පොරණ කිවිඳුන් සොඳ
රස මුසු බසිනා
සියලු භෝග වස්තු ඉසුරු
හරිති නෙක් දනෝ
සව් සැප දෙන සිතුමිණ වන්
ප්‍රේමය හන්දා

1. මෙම ගීයේ ප්‍රේමය උපමා කරන්නේ කුමකට ද?
2. මෙම ගීයෙන් මතුවන රසය කුමක් ද?

(ලකුණු 4 X 5 = 20)

03. උම්මග්ග ජාතකයෙහි එන මහෞෂධ පඬිතුමා තමා ඉදිරියෙහි වූ සියලු අභියෝග

i. අධිෂ්ඨානශීලි භාවයෙන් ද
ii. ස්ථානෝචිත ප්‍රඥාවෙන් ද

ජය ගැනීමට සමත් විය. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් විමසන්න.
(ලකුණු 15)

**නැතහොත්**

"බැද්දේගම" නවකතාව සාර්ථක වීමට කතුවරයාගේ

i. භාෂා භාවිතය
ii. චරිත නිරූපණය

ඉවහල් වී ඇති ආකාරය එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් විමසන්න.
(ලකුණු 15)

04. දෙමව්පියන් දරුවන්ගේ අනාගත දියුණුව වෙනුවෙන් ක්‍රියා කරන අයුරු

i. විද්දත් දුවගේ පියා

ii. උග්ගසේනගේ දෙමව්පියන්

යන චරිත ඇසුරින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් විමසන්න. (ලකුණු 15)

**නැතහොත්**

සිරි රහල් හිමියන් අපූර්ව කාව්‍යෝක්ති භාවිතයේ සමතෙකු වන්නේ,

i. ශබ්ද රසය

ii. අර්ථ රසය මනාව සංකලනය කරගන්නා බැවිණි. මග විසිතුරු පාඩම ඇසුරින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් විමසන්න. (ලකුණු 15)

05. ගැමි සමාජය උපදෙසින් හැඩගැස්වීම ට උපදේශ කාව්‍ය හෙවත් දැනමුතුකමට කියන කවි ඉවහල් වෙයි. නිර්දිෂ්ට ජනකවි ඇසුරින් උදාහරණ තුනක් දෙමින් විමසන්න. (භානා හීය පානා අඬ හැරෙන් දූනේ.) (ලකුණු 10)

06. තම ස්වාමියාට දක්වන අසීමිත භක්තියත් දරු සෙනෙහසත් අතර දෝලනය වන චරිතයක් ලෙස සුප්පා දේවියගේ චරිතය පිළිබඳ උදාහරණ තුනක් දෙමින් විමසන්න. (ලකුණු 10)

07. ගංගාවේ සංගීතය පද්‍ය පන්තිය තුළින් ජීවිතයේ අරුත මනා කොට විග්‍රහ කිරීමට සමත් වී ඇත. උදාහරණ තුනක් දෙමින් විමසන්න. (ලකුණු 10)